# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,257 - 2021 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 258 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 265 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 දෙසැම්බර් මස 24 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කුසලක නානායක්කාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 මාර්තු මස 10 වැනි දින ප්‍රදානය කර ඇති මාතර/ප්‍ර 2458 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඕවිටිගමුව පදිංචි පරණවිතාරණගේ මැණික්හාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 1322 යටතේ 1982.04.30 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩපත්තුව උතුර පත්තුවේ ඕවිටිගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඕවිටිගමුව නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 12 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි ඔහු විසින් සම්පාදිත අංක අ.ග.පි. 572 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 517 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 16 ක් විශාලත්වය ඇත්තාවූ ද, තේක්කවත්ත නැමැති පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 572 හි 494 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 572 හි 518 කැබැල්ල, |
| *දකුණට* | : | අ.ග.පි. 572 හි 516, 520, 519 කැබලි, |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 572 හි 514 කැබැල්ල. |

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල.

12-99/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ගනේෂ අමරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.03.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 2404 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොටපොල පදිංචි ජයවර්ධන පතිරණගේ සර්නේලිස් වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 772 යටතේ 1982.04.28 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක පත්තුවේ/කෝරළේ කොටපොල දකුණ (දැනට කොස්මෝදර) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පොද්දන නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 40 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ.ග.පි. 45 දරන කට්ටි කැබීමේ පිඹුරේ/ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1432 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 34 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මැදගොඩහේන

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 45 හි 374 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 45 හි 374 කැබැල්ල, |
| *දකුණට* | : | අ.ග.පි. 45 හි 1433, 388 කැබලි, |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 45 හි 1341 කැබැල්ල. |

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2021 මැයි මස 10 වැනි දින,

12-99/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය කොමසාරිස් (අන්තර් පළාත්) ගනේෂ අමරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.02 දින ප්‍රදානය කර ඇති අංක මාර/6/ප්‍ර 17937 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු පොද්දන පදිංචි මාවිට ගමගේ පීටර් වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 661 යටතේ 1996.01.25 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක, පත්තුවේ/කෝරළේ පොද්දන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පොද්දන නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 116 දරන කට්ටි කැබීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 01, විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : වරාගහතුඩුවහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | එන්. කේ. ඇඩ්වින්ගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | කේ. කේ. ආරියසේනගේ ඉඩම සහ ගම්මායිම් පාර, |
| *දකුණට* | : | එච්. ආර්. එල්. ආරියදාසගේ ඉඩම, |
| *බස්නාහිරට* | : | දොල රක්ෂිතය. |

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2021 මාර්තු මස 23 වැනි දින,

12-99/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය කොමසාරිස් (අන්තර් පළාත්) ගනේෂ අමරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.08.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 8276 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු දෙනියාය (දැනට දෙනියාය බටහිර) පදිංචි එඩ්වින් අබේසිංහ වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 562 යටතේ 1991.08.16 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක කෝරළේ, දෙනියාය (දෙනියාය බටහිර) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මතුගොබේ හා පල්ලෙගම නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1 කැ. මැ. මු. පි. 30 දරන කට්ටි කැබීමේ පිඹුරේ රේඛා සටහනේ අංක 119 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 00, පර්චස් 14 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : දියදාව.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැ. මැ. මු. පි. 30 සී 116 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | කැ. මැ. මු. පි. 30 සී 118 සහ ඇල, |
| *දකුණට* | : | කැ. මැ. මු. පි. 30 සී 81 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | කැ. මැ. මු. පි. 30 සී 112 කැබැල්ල. |

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2021 අප්‍රේල් මස 30 වැනි දින,

12-99/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.28 දින ප්‍රදානය කර ඇති අංක මාර/9/ප්‍ර/19726 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන තිහගොඩ, බටුවිට, කෝන්ගහදෙනිය "ජයමාලි" හි පදිංචි හේවා කසකාරගේ සුමිතා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 2383 යටතේ 1995.12.26 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ (දකුණ) පත්තුවේ, බටුවිට I ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බටුවිට නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මාර/90/080 දරන අනුරේඛනයේ අංක කිවු දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.142 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කෝංගහ දෙනිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | යෝජිත මාර්ගය, |
| *නැගෙනහිරට* | : | මාර/90/080 අනුරේඛනයේ ආර් කැබැල්ල, |
| *දකුණට* | : | මු.පි.මාර 1177 පිඹුරේ අංක 6 1/2 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | කුඹුර. |

උමේෂා මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

2021 ජූලි මස 26 වැනි දින.

12-99/5

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජුනි 20 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/5294 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අක්කර පනහ, මැදඋයන්ගොඩ පදිංචි හේවා ලුණුවිලගේ සව්නේරිස් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ගබප(ද)/19/90/86 (LDO 90) යටතේ 1986.01.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.12.31 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟබඩ දකුණ පත්තුවේ, යටියන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මැදඋයන්ගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 025/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු.පි.මාර 1055 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 69 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 34 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මාස්මුල්ලෙ කැලේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු.පි.මාර 1055 හි 67, 68 කැබලි, |
| *නැගෙනහිරට* | : | හි.පි. 169974 කැබැල්ල, |
| *දකුණට* | : | මු.පි.මාර 1055 හි 70 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | මු.පි.මාර 1055 හි 72 1/2, 71 කැබලි. |

ප්‍රාදේශීය ලේකම්/
(අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/
සහකාර ඉඩම් කොමසාරිස්,

උමේෂා මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

2021 ජූලි මස 26 වැනි දින.

12-99/6

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කඹුරුගමුවෙ ගාල්ලගේ රවීන්ද්‍ර ජයනාත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජුනි 21 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/5918 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන අකුරුගොඩ පදිංචි තුප්පහි පටබැඳිගේ විල්මට් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 586 යටතේ 1993.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම පත්තුවේ/කෝරළේ අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අකුරුගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 0 24/15,23,24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ ඔහු විසින් සම්පාදිත අංක මු.පි.මාර 1040 දරන කට්ටි කැබීමේ පිඹුරේ/ ඔහු විසින් සම්පාදිත අංක 0/24 2B දරන රේඛා සටහනේ අංක 28 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 12 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද හොරකැටිය රජයේ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු.පි.මාර 1040 හි 27 කැබල්ල, |
| *නැගෙනහිරට* | : | මු.පි.මාර 1040 හි 40 කැබල්ල, |
| *දකුණට* | : | මු.පි.මාර 1040 හි 29 කැබල්ල, |
| *බස්නාහිරට* | : | මු.පි.මාර 1040 හි 09 කැබල්ල. |

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්/
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්,
(අන්තර් පළාත්),
මාලිම්බඩ

2020 පෙබරවාරි මස 05 වැනි දින,

12-99/7

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සුසන්ත අත්තනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.14 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/10817 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන කළුවලාකැටිය, පල්ලාවෙල පදිංචි කුඩා අන්තෝනිගේ මින්ගෝරිස් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2860 යටතේ 1986.12.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

දකුණු පළාතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දබඩ (බටහිර) පත්තුවේ පල්ලාවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පල්ලාවෙල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අ.ග.පි. 166 දරන කට්ටි කැබීමේ පිඹුරේ 578 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.465 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: කළුවලාකැටිය

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 166 හි 248, 571 කැබලි, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 166 හි 249, 580 කැබලි, |
| *දකුණට* | : | අ.ග.පි. 166 හි 579, 580 කැබලි, |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 166 හි 571, 577 කැබලි. |

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2019 මාර්තු මස 22 වැනි දින,

12-99/8

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) දීපිකා කේ. ගුණරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් 09 දින ප්‍රදානය කර ඇති අංක මාර/3/ප්‍ර/19596 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන හොරගොඩ, අඳාදෙළ වත්ත පදිංචි වැලිහේන ගමගේ මැන්ඩිස් අප්පුහාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 2170 යටතේ 1995 දෙසැම්බර් 15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් පත්තුවේ/ කෝරලේ හොරගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හොරගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මිනින්දෝරු අධිකාරී භාරයේ ඇති සහ ඔහු විසින් සම්පාදිත අංක මාර/91/382 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 30 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.202 ක විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර/91/382 හි පාර සහ අංක 29 කැබැල්ලෙන් කොටසක්, |
| *නැගෙනහිරට* | : | මාර/91/382 හි පාර සහ අංක 29 කැබැල්ල, |
| *දකුණට* | : | මාර/91/382 හි පාර සහ අංක 31 කැබැල්ලෙන් කොටසක්, |
| *බස්නාහිරට* | : | මාර/91/382 හි පාර සහ අංක 31 කැබැල්ල. |

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2018 මැයි මස 01 වැනි දින.

12-99/9

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කඹුරුගමුවෙ ගාල්ලගේ රවීන්ද්‍ර ජයනාත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 ජූනි 21 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/5926 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන අකුරුගොඩ පදිංචි ජාසිං පතිරණගේ ආරියපාල වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 585 යටතේ 1993.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් පත්තුවේ අකුරුගොඩ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අකුරුගොඩ නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මාතර මිනින්දෝරු අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 0 24/15,23,24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ ඔහු විසින් සම්පාදිත අංක මු.පි.මාර. 1040 දරන කට්ටි කැඩීමේ පිඹුරේ /ඔහු විසින් සම්පාදිත අංක 0/24 2B දරන රේඛා සටහනේ අංක 37 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 00 රූඩ් 01 පර්චස් 39 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද හොරකැටිය රජයේ ඉඩම:

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු. පි. මාර 1040 හි 09,38 කැබලි, |
| *නැගෙනහිරට* | : | මු. පි. මාර 1040 හි 09 කැබැල්ල, |
| *දකුණට* | : | මු. පි. මාර 1040 හි 36 කැබැල්ල |
| *බස්නාහිරට* | : | මු. පි. මාර 1040 හි 09 කැබැල්ල. |

කේ. ජී. ආර්. ජයනාත්,
ප්‍රාදේශීය ලේකම්,
මාලිම්බඩ.

2019 දෙසැම්බර් මස 24 වැනි දින,

12-99/10

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් ඕ. වී. චන්දන තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.12.10 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/36713 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන අකුරැස්ස, යාකබැද්ද පාර, විල්හේන පදිංචි අක්මීමන හෙට්ටිආරච්චිගේ සුනිල් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 2249 යටතේ 1997.06.23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ යාකබැද්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ යාකබැද්ද නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මාර/පී/89/112 දරන රේඛා සටහනේ අංක BC දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 20 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද

ඉඩමේ නමඃ විල්ලේහේන

| | | |
|---|---|---|
| *උතුරට* | : | XB කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | මාර්ගය, |
| *දකුණට* | : | PC කැබැල්ල, |
| *බස්නාහිරට* | : | CC සහ JC කැබැලි. |

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2018 ජූලි මස 25 වැනි දින,

12-99/11

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් චින්තක අබේවික්‍රම වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1940.12.18 දින ප්‍රදානය කර ඇති එම්. ආර්. 283 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන නාරන්දෙණිය පදිංචි පහලගේ සවුන්දිරිසා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 7989 යටතේ 1941.07.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.31 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගගබඩ පත්තුවේ නාරන්දෙණිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නාරන්දෙණිය නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත 1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ.ග.පි. 513 දරන රේඛා සටහනේ අංක 80 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් අක්කර 02 රූඩ් 01 පර්චස් 11 ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමඃ නුගආරදෙනියහේන හෙවත් තලගහහේන

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 513 හි 79 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | ටී. පී. 282671, |
| *දකුණට* | : | ටී. පී. 282485, ටී. පී. 282712, |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 513 හි 39 එස් හා කැබලි අංක 79. |

චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2020 ජනවාරි මස 06 වැනි දින,

12-99/12

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ටී. ජී. ඩී. නිලංගි ඩයස් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.16 දින ප්‍රදානය කර ඇති අංක 2/ගා/11/ප්‍ර 40711 එල්. එල්. 30819 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වල්පල පදිංචි සේනාධීරගේ හින්නිහාමි වෙත ප්‍රදානය කොට ගාල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. ඩී. 42/161 යටතේ 1997.05.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.24 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්පෙ (උතුර) පත්තුවේ/කෝරළේ බඳුංගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අ.ග.පි. 645 වල්පල නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකක් රූඩ් ... පර්චස් .. ක් විශාලත්වය ඇත්තාවූද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩමඃ පිංගොඩකන්ද

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඉඩම් කට්ටි හරහා යන රජයේ පාර, |
| *නැගෙනහිරට* | : | එම්. ජී. තෙබේරිස්ගේ රජයේ බදු ඉඩම, |
| *දකුණට* | : | ගොඩාරඹවත්ත ප්‍රවේණි ඉඩම, |
| *බස්නාහිරට* | : | එම්. ජී. කරුණාපාලගේ රජයේ බදු ඉඩම. |

ටී. ජී. ඩී. නිලංගි ඩයස්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
යක්කලමුල්ල.

2021 මාර්තු මස 09 වැනි දින,

12-98/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් බන්දුල ප්‍රීතිරාජ් අබේසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 පෙබරවාරි මස 23 දින ප්‍රදානය කර ඇති අංක ගා/ප්‍ර 1485 එල්. එල්. 3664 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන කටුවත්ත පදිංචි රණතුංග මිසිනෝනා වෙත ප්‍රදානය කොට බලපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 590 යටතේ 1985.08.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.12.24 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වලල්ලාවිට කෝරලේ බටහිර අංක 14ඒ මීරිස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කටුඅත්ත නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ගාල්ල මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. ගා. 63 අංක දරන පිඹුරේ අංක 15 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් නමයක් (9) ක් විශාලත්වය ඇත්තා වූද මානවත්ත දෙණිය යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 09 සහ 14, |
| *නැගෙනහිරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 09, |
| *දකුණට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 14 හා හි. පි. 278520, |
| *බස්නාහිරට* | : | මෙම සැලැස්මේ කැබලි අංක 04. |

බී. පී. අබේසේකර,
ප්‍රාදේශීය ලේකම්,
බෙන්තොට.

2021 මාර්තු මස 24 වැනි දින,

12-98/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/57266.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : ප.ඉ.කො./6/1/කළු/110.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 836 සී, කපුගෙදර ග්‍රාම නිලධාරි වසමේ පැළෑද ගමේ අංක අ.ග.පි. 132 හි KA/PLN/09/69 අනුරේඛනයේ කැබලි අංක A වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.5353 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා නිසල අරණ සෙනසුන ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානය භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : කැබලි අංක $9^{D43}$ සහ $9^{D40}$,
*නැගෙනහිරට* : කැබලි අංක $9^{D40}$,
*දකුණට* : කැබලි අංක $9^{D40}$, $9^{D57}$ සහ $9^{D44}$,
*බටහිරට* : කැබලි අංක $9^{D44}$ සහ $9^{D43}$.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.04.22 දින සිට ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* .- නැත.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන 2021.04.22 දින සිට වසර 05 ක අවම කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදුදීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළමු දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2021 දෙසැම්බර් මස 03 දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-100

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

## 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර්** | 2021.12.03 | සිකුරාදා | 2021.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.10 | සිකුරාදා | 2021.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.17 | සිකුරාදා | 2021.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.24 | සිකුරාදා | 2021.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.31 | සිකුරාදා | 2021.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

## 2022 වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.